**ශීර්ෂය 051- ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන්හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.2 හා 1.6.3 (අ) දරන ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන්ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදීද ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(vi) ඡේදය ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂය එදිනට මුදල් පොතේ සඳහන් ශේෂයට සමාන අගයක් නොගන්නා බැවින් එම ශේෂය සැසඳීම සඳහා අක්මුදල් ගැලපීම් ගිණුමක් සකස් කළ යුතු වුවත් එසේ සකස් කරන ලද අක්මුදල් ගිණුමෙහි පහත ගැලපීම් නිවැරදිව සිදුකර නොතිබුණි. | | |

| | | |
|---|---|---|
| (අ) අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් හර කරන ලද වියදම් රු.31,527,238 ක් වුවත් එය රු. 31,526,733ක් ලෙස දක්වා තිබුණි. | නිවරදි අගයන් දැක්වීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු සලසා ඇත. |
| (ආ) අත්තිකාරම් "බී" ගිණුමේ හර ලෙස රු.13,317,998 ක් හා බැර ලෙස රු.8,171,750 ක් ලෙස සටහන් කළ යුතු වුවත් එම අගයන් පිළිවෙලින් රු.16,433,008 ක් හා රු.11,131,063 ක් ලෙස දක්වා තිබුණි. | අමාත්‍යාංශ පොත් අනුව හා අත්තිකාරම් බී ගිණුමට අදාල භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව නොසැසඳීම මෙහිදී ඇතුළත් කළ යුතුය. | අත්තිකාරම් බී ගිණුමේ හර ශේෂය ලෙස සටහන් කර ඇත්තේ 051012 යටතේ සටහන් වූ ගනුදෙනුය. |
| (ඇ) පොදු තැන්පත් ගිණුමට ලැබීම් ලෙස රු.10,916,507 ක් සටහන් කළ යුතු වුවද එම අගය රු.11,874,704 ක් ලෙස දක්වා තිබුණ අතර පොදු තැන්පත් ගිණුමට ගෙවීම් ලෙස අක්මුදල් ගැලපීම් ගිණුමට යා යුතු ශේෂයන් නොමැති වුවද එය රු.542,625 ක් ලෙස දක්වා තිබුණි. | අමාත්‍යාංශ පොත් අනුව සහ පොදු තැන්පත් ගිණුමට අදාල භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව නොසැසඳීම ඇතුළත් කළ යුතුය. | පොදු තැන්පත් ගිණුමේ හරස් සටහන් ලැබීම් මුදල සටහන් කර ඇත. |
| (ඈ) 194 වැය ශීර්ෂයෙන් 051 ශීර්ෂයට මාරුකළ වියදමක් ලෙස දැක්විය යුතු රු.3,936,980 ක් හා ලැබීම් ලෙස දැක්විය යුතුරු.36,144 ක් ගැලපුම් ගිණුමේ දක්වා තිබුණි. | නිවැරදිව අක්මුදල් ගැලපීම් ගිණුම සකස් කිරීම කළ යුතුය. | මෙම අමාත්‍යාංශයේ 194 වැය ශීර්ෂය යටතේ පවත්නා කාලයේ 194 වැය ශීර්ෂයෙන් දරන ලද වියදම් හා ලැබීම් ලෙස විමසුමේ සඳහන් කර ඇති මුදල ගැලපුම් ගිණුමේ සටහන් කරන ලදී. |
| (ඉ) ගැලපුම් ගිණුමට අදාල නොවන අනෙකුත් ලැබීම් ලෙස රු.1,422,869 ක් අඩුකර තිබුණි. | නිවැරදිව අක් මුදල් ගැලපීම් ගිණුම සකස් කිරීම කළ යුතුය. | වෙනත් ලැබීම්, මුළු මුදල රු.1,952,403 කි. මෙයින් මුදලින් ලැබීම් රු.529,534 කි. ඉතිරිය ගැලපුම් ගිණුමට මාරුකරන ලදී. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශ විසින් රැස්කර තිබූ ආදායම් නොවන වෙනත් ලැබීම් එකතුව රු.2,666,390 ක් වුවද එම අගය රු.1,952,403 ක් ලෙස රු.713,987 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මේ යටතේ දැක්විය යුත්තේ වෙනත් ආදායම් ශිර්ෂය යටතේ ලද ආදායම් වුවත් එහි නිවැරදි එකතුව දැක්විය යුතුය. | වෙනත් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කරන ලද්දේ විවිධ ආදායම් ශීර්ෂ යටතේ පමණක් ලැබුණු ආදායම්ය. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ආදායම් නොවන ලැබීම් ලෙස රු.2,666,390 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වුවද එය රු.529,534 ක් ලෙස රු.2,136,856 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලද නිවැරදිව ගණනය කරන ලද ආදායම, ආදායම් නොවන ලැබීම් යටතේ පෙන්විය යුතුය. | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ ආදායම් නොවන ලැබීම් ලෙස දක්වා ඇත්තේ මුදලින් පමණක් ආදායම් ශීර්ෂ සඳහා ලද ආදායම පමණි. |
| (ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සඳහා මුදල් වැය කිරීම් ලෙස රු.437,166,604 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වුවද එය රු.1,647,930,146 ක් ලෙස, රු.1,210,763,542 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ගීකරණයන් නිවැරදිව සිදු කර සත්‍ය තත්ත්වය මුදල් ප්‍රවාහ ප්‍රකාශයතුල පෙන්විය යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ඇතුළු ප්‍රධාන වර්ගීකරණයන් තුළ අනෙකුත් වර්ගීකරණයන්ට අදාල වියදමක් අන්තර්ගත වී ඇත. එහෙත් සම්පූර්ණ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මූල්‍ය ගලායාම්වල මුළු අගයට බලපෑමක් සිදු නොවේ. |

| | | |
|---|---|---|
| (ඇ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අත්තිකාරම් අයකර ගැනීම් ලෙස රු.3,170,128 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වුවද එය රු.210,815 ක් ලෙස රු.2,959,313 ක් අඩුවෙන් දක්වා තිබුණි. අත්තිකාරම් ගෙවීම රු.5,641,991 ක් වුවද එය රු.2,526,921 ලෙස අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් වැයකිරීම් යටතේ දක්වා තිබුණි. | අත්තිකාරම් අයකර ගැනීම් හා ගෙවීම් ලෙස මුදලින් හා හරස් සටහන් එකතුව දැක්විය යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළට ඇතුළත් කරනු ලබන්නේ මුදලින් සිදුකරන ලද ගනුදෙනු පමණක් බැවින් අත්තිකාරම් අයකරගැනීම් හා ගෙවීම් ලෙස සටහන් කර ඇත්තේ මුදලින් අයකර ගැනීම් හා ගෙවීම් පමණි. |
| (ඈ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූමුදල්ප්‍රවාහයේමුදල්වැයකිරීම්යටතේභෞතිකවත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම් රු.1,398,842,481 ක් වුවද එය රු.183,740,445 ක් ලෙස දක්වා තිබුණි. | මුදලින් සිදුකරන ලද භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජනවල නිවැරදි අගය ඇතුළත් කළ යුතුය. | මුදලින් සිදුකරන ලද මිලදී ගැනීම් පමණක් ඇතුළත් කර ඇත. |
| (ඉ) මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ තැන්පතු ලැබීම් රු.3,853,656 ක් හා තැන්පතු ගෙවීම් රු.13,020,957 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වුවද එය පිළිවෙලින් රු.2,393,826 ක් හා රු.12,418,462 ක් ලෙස දක්වා තිබුණි. | අමාත්‍යාංශ පොත් අනුව තැන්පත් ගිණුම්වල ලැබීම් එකතුව හා ගෙවීම්වල එකතුව දැක්විය යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළට ඇතුළත් කරනු ලබන්නේ මුදලින් සිදුකරන ලද ගනුදෙනු පමණක් බැවින් තැන්පතු ලැබීම් හා ගෙවීම් ලෙස ඇතුළත් කර ඇත්තේ මුදලින් ලද ලැබීම් හා ගෙවීම් පමණි. |

## 1.6.4 අග්‍රිම ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| භාණ්ඩාගාරයට ආපසු යවන ලද රු.1,500,000 ක අග්‍රිමය, අග්‍රිම ගිණුමේ සටහන් කර නොතිබීම හේතුවෙන් අග්‍රිම ගිණුම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ආපසු යවන ලද අග්‍රිමය අග්‍රිම ගිණුමේ ශේෂයෙන් අඩුකිරීමක් ලෙස සටහන් කළ යුතුය. | ජනවාරි මාසයේදී මහා භාණ්ඩාගාරය විසින් දෙනු ලැබූ රු.1,500,000 ක මුදල නැවත එම මාසයේදීම භාණ්ඩාගාරයට පවරා ගෙන ඇත. ඒ අනුව අග්‍රිම ගිණුම භාණ්ඩාගාර ගිණුම් සටහන් අනුව තුළනය වී ශේෂය රු.0 ක් ලෙස සටහන්කර ඇත. |

## 1.6.5 සීමා ඉක්මවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2004 ඔක්තෝබර් 11 දිනැති අයවැය චක්‍රලේඛ අංක 118 හි 2.1 අනුව සීමා පිළිපැදිය යුතු වුවත් මෙම අමාත්‍යාංශය අවම ලැබීම් සීමාවට ලඟාවී නොතිබුණි. එසේ ලඟා නොවීම රු.1,100,899 ක් වුවද වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ අවම ලැබීම් සීමාව රු.1,300,000 ක් ලෙස දක්වා සීමා ඉක්මවීමක් / පහත වැටීමක් නොමැති බවට ගිණුමේ දක්වා තිබුණි. | ගිණුම්වල නිවැරදි තත්ත්වය පෙන්විය යුතු අතර සීමා ඉක්මවීමට ප්‍රථම එම සීමා ඉක්මවීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතුය. | අවම ලැබීම් සීමාව සංශෝධනය සඳහා අයදුම්පත්‍ර භාණ්ඩාගාරය වෙත 2019 වර්ෂය තුළදීම යොමුකළ අතර භාණ්ඩාගාරය විසින් එය නිර්දේශ කර ඇත. |

**1.6.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුවඅමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීතාවය ඉහළ මට්ටමට ඔසවා තැබීමට කටයුතු සිදුකර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පුනරාවර්තන වැය විෂයයන් 01 කට හා ප්‍රාග්ධන වැය විෂයයන් 02 කට වර්ෂය තුළ සැලසුම් කළ පරිදි භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් නොකිරීම නිසා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු රු.1,533,438,050 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | වර්ෂය තුළ ලබාගත හැකි මුදල් ප්‍රමාණයට පමණක් සැලසුම් සකස් කර අනුමැතිය ලබා ගත යුතුය. | අක්මුදල් නොලැබීම මත ප්‍රතිපාදන ඉතිරි විය. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අධි ප්‍රතිපාදන ලබාගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 03 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 08 ක ප්‍රතිපාදනය උපයෝජනය කිරීමෙන් පසුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.10,381,559 ක් එනම් සියයට 15 සිට සියයට 100 ක් දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණ විය. | නිසි පරිදි මූලික සැලසුම් සිදුකර අවශ්‍යා ප්‍රමාණයට පමණක් ප්‍රතිපාදන ලබා ගත යුතුය. | අවශ්‍යතා ඇති නොවීම, මූලික සැලසුම් වෙනස් කිරීම, විවිධ ගැටළු මත සැලසුම් කළ කාර්යයන් ඉටුකළ නොහැකිවීම් මත ප්‍රතිපාදන ඉතිරිවීම. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව බැරකම් ශේෂය රු.364,859,701 ක් වුවද බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව එය රු.365,381,841 ක් වූයෙන් රු.522,139 ක් වැඩියෙන් දක්වා තිබුණි. | දෝෂ හඳුනාගෙන නිවැරදි තොරතුරු ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුය. | බැරකම් වාර්තාව මුද්‍රණය කිරීමේ දෝෂයක් බව නිරීක්ෂණය වේ. මෙවැනි දෝෂ සිදු නොවීමට උපදෙස් දුන්නෙමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතීන් 10 ක් නිමකළ යුතු වුවත් කාර්යසාධන වාර්තාවට අනුව ව්‍යාපෘතීන් 04 ක් පමණක් නිමකර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ කටයුතු කළ යුතුය. | ක්‍රියාකාරී සැලැස්ම පරිදි සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හිමිවිය යුතු ව්‍යාපෘති 10 න් 04 ක් සියයට සියයක් සම්පූර්ණ කර ඇත. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට ඩිජිටල් හා යටිතල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වූවත් පහත කරුණුවලට අනුව එම අවශ්‍යතාවය ඉටු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය නොවීය . | | |
| (අ)2019 වර්ෂය වනවිට ජංගම දූරකථන සනත්වය පුද්ගලයින් සියයට 100 සිට සියයට 150.8 දක්වා වර්ධනය වී තිබුණද සක්‍රීය ග්‍රාහක මොඩියුල් පත් එකකට වැඩි ප්‍රමාණයක් තනි පුද්ගලයෙකු විසින් පාවිච්චි කරන බැවින් ජංගම දූරකථන සනත්වයේ වර්ධනය අවිනිශ්චිත බව නිරීක්ෂණය විය. | එක් පුද්ගලයෙකුට නිකුත් කරන සිම්පත් ප්‍රමාණය පිළිබඳව විධිමත් නියාමනයක් සිදු කළ යුතු අතර ජංගම දූරකථන සනත්වය මැනීම සඳහා නිවැරදි දර්ශකයන් හඳුනාගත යුතුය. | එකම පුද්ගලයෙකුට සම්බන්ධතා එකකට වැඩි ප්‍රමාණයක් තිබිය හැකි බව පිළිගත හැකිය. කෙසේ වුවද මෙම කාරණය මැනීම සඳහා වඩාත් නිවැරදි දර්ශකයන් හඳුන්වා දීමට ITU සලකා බලමින් පවතී. එසේම ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ පනවනු ලබන රෙගුලාසි මගින් එක් පුද්ගලයෙකුට නිකුත් කරන සිම්පත් ප්‍රමාණය පිළිබඳව නියාමනය කරනු ලැබේ. |
| (ආ)ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංඛ්‍යා ලේඛන අනුව අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව 2017, 2018 හා 2019 වර්ෂවලදී පිළිවෙලින් 6,747,154 ක්, 10,562,675 ක් හා 13,408,403 ක් වූ නමුත් එම ප්‍රමාණයන් ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත වීමඉතා පහල මට්ටමක පැවතුණි. | ශ්‍රී ලංකාවේ අන්තර්ජාල ව්‍යාප්තිය ජනගහනය හා භූගෝලීය වශයෙන් සැසඳීමේදී ප්‍රාදේශීය පරිහරණය පහල අගයන් ගන්නා බැවින් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වර්ධනය කිරීම හා පවතින යටිතල පහුසකම් පිළිබඳ පසු විපරම් | 2017 හා 2019 වර්ෂ සැසඳීමේදී සියයට 61 කට වැඩි අන්තර්ජාල සේවා සනත්වයක් පෙන්නුම් කරන අතර සෙසු කලාපීය රටවල් හා සැසඳීමේදී එය ශ්‍රී ලංකාවේ එම අගය ඉතා ඉහළ වේ. වසරින් වසර අන්තර්ජාල සේවා භාවිතාකරන්නන්ගේ ප්‍රමාණය වැඩිවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. |

| | | |
|---|---|---|
| | කළ යුතුය. තවද අන්තර්ජාල භාවිතාකරන්නන්ගේ සංඛ්‍යාව නිවැරදිව ගණනය කිරීම සඳහා යෝග්‍ය ක්‍රමයක් හඳුනා ගත යුතුය. | |
| (ඇ)2019 වර්ෂය වනවිට ADSL අන්ත්ර්ජාල පහසුකම් ලබාගෙන ඇති ප්‍රමාණය 908418 ක් පමණක් විය. මෙයින් සියයට 42.66 ක් බස්නාහිර පළාතේ හා සියයට 0.46 සිට සියයට 31.18 දක්වා ප්‍රමාණයන් අනෙකුත් පළාත් අතර ව්‍යාප්ත වී තිබීමෙන් ග්‍රාමීය ප්‍රදේශවල **ADSL** අන්තර්ජාල පහසුකම්වලව්‍යාප්තිය ඉතා පහළ මට්ටමක් පැවැතුනි. | සෑම පළාතකටම අන්තර්ජාල පහසුකම් වර්ධනය කිරීම සඳහා කටයුතු කළ යුතුය. | ADSLභාවිතයට වඩා වේගවත් හා ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු අන්තර්ජාල මාධ්‍යක් ලෙස ප්‍රකාශ තන්තු තාක්ෂණ (Optical Fiber Technology)කෙරෙහි සේවා සපයන්නන් යොමු වී ඇති අතර ඒ සඳහා අවශ්‍ය නියාමන හා සෙසු පහසුකම් සැපයීම TRCSL මගින් සිදුකරනු ලැබේ. |
| (ඈ)2012 වර්ෂයේදී 3,449,391 ක් වූ ස්ථාවර දුරකථන ප්‍රමාණය ක්‍රමිකව අඩුවී 2019 වර්ෂය වනවිට 2,299,767 ක් වී තිබුණි. මේ අනුවඅන්තර්ජාල පහසුකම් සහිත ස්ථාවර දුරකථන ප්‍රමාණයද පහල අගයක් ගන්නා බව නිරීක්ෂණය විය. | ස්ථාවර දුරකථන මගින් ස්ථාවර බ්‍රෝඩ් බෑන්ඩ් ග්‍රාහක සංඛ්‍යාව වැඩිකර ගැනීම සඳහා ජනතාව යොමු කර ගැනීමට කටයුතු කළ යුතුය. | ශ්‍රී ලංකාවේ සියලුම පළාත් වලට බ්‍රෝඩ්බෑන්ඩ් අන්තර්ජාල සම්බන්ධතා කඩිනමින් ලබාදීමේ පියවරක් ලෙස TRCSL විසින් “ගමට සන්නිවේදනය” නමින් ව්‍යාපෘතියක් හා අන්තර්ජාලය වඩාත් ඵලදායීව භාවිතා කිරීම පිණිස අවශ්‍ය දැනුවත් කිරීමේ ව්‍යාපෘති කිහිපයක්ම ක්‍රියාත්මක කර ඇත. ඒ වැඩසහන යටතේ පාර්ශවකරුවන්ගේ දායකත්වයද ලබාගෙන සෑම පළාතකටම අන්තර්ජාල ව්‍යාපෘතිය වර්ධනය කිරීම සඳහා ඉදිරියේදී කටයුුතු සම්පාදනය කර ඇත. |
| (ඉ) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවර්ධනය පිළිබඳ ඊ-රාජ්‍යය සමීක්ෂණ වාර්තාවට (United Nations E-Government Survey) අනුව 2012 වර්ෂයේදී 192 ක් වූ ශ්‍රී ලංකාවේ | ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකයේ ශ්‍රී ලංකාවේ ගෝලීය ස්ථානය හා දර්ශකයේ | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවර්ධනය පිළිබඳ ඊ-රාජ්‍ය සමීක්ෂණ වාර්තාවේ ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය අනුව ලංකාවේ |

| | | |
|---|---|---|
| ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය 2014, වර්ෂයේදී 74 දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද 2020 වර්ෂයේදී එම දර්ශකය 85 දක්වා අඩුවී තිබුණි. | ප්‍රමාණාත්මක තත්ත්වය ඉහළ දැමීමට කටයුතු කළ යුතු අතර ඊ-රාජ්‍ය ප්‍රතිපත්ථිය සඳහා අනුමැතිය ලබාගෙන එය ක්‍රියාවේ යෙදවිය යුතුය. | ස්ථානය උච්චාවචනය වීමට අනෙකුත් රටවල්වල ක්‍රියාකාරීත්වයද බලපාන අතර එම වාර්තාව අනුව ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ පළවන රට ලෙසද මුළු ආසියාවේම 24 වන ස්ථානයටද පත්ව ඇත. ICTA ආයතනය විසින් නිරන්තරයෙන් සිදුකරන ලද ප්‍රතිපත්තිමය හා ව්‍යාපෘති පාදක මැදිහත්වීම් තුළින් අන්තර් ආයතන මට්ටමින් හා ආයතනික මට්ටමින් ඊ-සේවාවන් හඳුන්වා දීමට කටයුතු කරන ලදී. ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ඊ-රාජ්‍ය අංශයේ කටයුතු වඩාත් විධිමත් හා තිරසර බවට පත්කිරීමට යාවත්කාලීන කරන ලද ඊ-රාජ්‍ය ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී. |
| (ඊ)ආර්ථිකය ඩිජිටල්කරණය කිරීම සහ පාසල් සඳහා පරිගණක හා පරිගණක උපාංග මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත රු.මිලියන 1,055 ක් වාර්ෂික ඇස්තමේන්තු මගින් ලබාදී තිබුණද එහි මූල්‍ය ප්‍රගතිය සියයට 53 ක් පමණක් විය. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමටත් වර්ෂය සඳහා ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමටත් ක්‍රියාමාර්ග ගත යුතුය. | ආර්ථික ඩිජිටල්කරණය කිරීම යටතේ ක්‍රියාත්මක වූ එක් ව්‍යාපෘතියක් වන ඊ-ග්‍රාමනිලධාරී ව්‍යාපෘතියට අදාලව 2019 වර්ෂයේදී දෘඩාංග මිලදී ගැනීමට නියමිතව තිබුණද එම වසරේදී අදාල සැපයුම්කරු වෙත සියයට 20 ක අත්තිකාරම් මුදල ගෙවීමට නොහැකිවීම මත දෘඩාංග මිලදී ගැනීමක් සිදු නොවුනි. වර්ෂයේ සමස්ත මූල්‍ය ප්‍රගතිය අඩුවීමට එය හේතුවක් වී ඇත. එසේම එම වර්ෂය අවසානයේ විෂය භාර අමාත්‍යාංශය වෙනස්වීම මත ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ඉදිරි කටයුතු කඩිනම් කළ නොහැකි විය |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අරමුණුවල ඉලක්ක කරා ලඟාවීමේදී අවශ්‍ය දර්ශක, සන්ධිස්ථාන හා අදාල කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට අදාල කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය. | අමාත්‍යාංශයේ පවතින මානව සම්පත් ඌනතාවය හේතුවෙන් ඒ ඒ ව්‍යාපෘති යටතේ වඩාත් විධිමත් හා සමීප පසුවිපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රියදුරන් දෙදෙනෙකු හා කාර්යාල කාර්ය සේවකයන් දෙදෙනෙකු අනුමත සේවක සංඛ්‍යාවෙන් බාහිරව බඳවාගෙන තිබුණ අතර අනුමත පරිපාලන නිලධාරී තනතුර සඳහා ස්ථිර පදනමින් බඳවා නොගෙන කොන්ත්‍රාත් පදනමින් 2019 වර්ෂයේදී බඳවාගෙන තිබුණි. | අනුමත පුරප්පාඩු ස්ථිර පදනමින් සම්පූර්ණ කළ යුතු අතර අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් බඳවා නොගත යුතුය. | ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ (කැබිනට් නොවන) වෙනුවෙන් අනුමත කර තිබූ කාර්යමණ්ඩලයේ රියදුරු සංඛ්‍යාව 09 ක් ලෙසද කාර්යාල සේවක සේවයේ තනතුරු සංඛ්‍යාව 08 ක් ද දක්වා අඩුවී තිබුණි. ඒ වන විට ඉහතින් සඳහන් කරන ලද බඳවා ගැනීම් සිදුකර තිබූ අතර එම නිසා රියදුරු තනතුරු 02 ක් හා කාර්යාල කාර්ය සහායක තනතුරු 02 ක් අතිරික්තව පැවතුණි. |